දූෂණය අල්ලස නාස්තිය සහ සංවර්ධනය

1 වෙනි පිටුවෙන්.....

ප්‍රමාණවත් නොවිණ. එයට පෙර රාජ්‍ය අංශයේ කටයුතු නිසි ලෙස මෙහෙයවීමට නිලධාරීන් බැඳී සිටි **AR** හෙවත් **Administrative Regulation** (පරිපාලන රෙගුලාසි) සහ **FR** හෙවත් **Financial Regulations** (මුදල් රෙගුලාසි) ආදිය පසෙකට විසිවිණ. රාජ්‍ය අංශයේ කටයුතු තුළ පගාව, දූෂණය, වංචාව හා වරප්‍රසාද නොමනා ලෙස යොදාගැනීම සාමාන්‍ය පිළිවෙත බවට පත්විය. ඒ යුගයේ රාජ්‍ය සේවකයන් කියූ පරිදි දැන් රජයේ කටයුතු කෙරෙන්නේ ඉහත සඳහන් කළ **AR, FR** අනුව නොව මේ සියල්ල ඇරඹූ **JR** අනුව බව ය.

ඉහවහා ගිය ව්‍යසනයක්

මෙලෙස දශක තුනක් ක්‍රමයෙන් වර්ධනය වී සකල ශ්‍රී ලංකා සමාජ පද්ධතිය තුළම විසිරී ඇති මේවා අද ඉමහත් ව්‍යසනයක් විපත්තියක් ව තිබේ.

රාජ්‍ය අංශයේ දූෂණය

රාජ්‍ය අංශයේ යම් කටයුත්තක් කර ගැනීමට ගිය විට ඒ සඳහා අදාල අංශවලට දොල පිදේනි නොදුන්න හොත් කටයුත්තට අදාළ ලිපි ගොණුවක්වත් සොයා ගැනීමට බැරිවෙයි. බොහෝ කාර්‍යාල වලට සම්බන්ධ වූ තරවිකාරයින් ඇත. එවැන්නකු අල්ලා නියමිත පගාව ගෙවූ විට කටයුත්ත ඉතා ඉක්මනින් ඉටුවෙයි. පිටරටකින් නැව්ගත කරන ලද භාණ්ඩ රේගුවෙන් ලබාගැනීමට ගියවිට එයටද ඒජන්ට් කෙනෙකු අල්ලා ගත යුතුවෙයි. ඒජන්ට්ලා කාක්කන් මෙන් රේගුව අසළ කරකැවෙමින් සිටිති. ඒජන්ත රේගුවේ සේවකයෙකු නොව පිටස්තරයෙකි. එහෙත් ඔහු ඇතුළත නිලධාරීන්ද, වැඩේ කරගැන්මට අල්ලාගත යුතු නියම නිලධාරියාද, ඔහුට ගෙවිය යුතු ගණනද දැන සිටී. ඔහුගේ උපදෙස් අනුව හැම පියවරකදීම අවශ්‍ය **ජරාව** දිය යුතුවෙයි. එවිට අප්‍රමාදව එදාම එම බඩු මුදවා ගත හැකිය. නැතිනම් මොන මට්ටමේ ඉහළ නියෝග ආවත් කටයුත්ත ඉටුකර ගතහැකි නොවේ. **ජරාව** නුදුන හොත් දින ගණනක් රස්තියාදු කරවනු ලැබේ. මේ සියළු **ජරාව** දවස අවසානයේ ඉහළ පහළ සෑම මට්ටමේම නිලධාරීන් අතර බෙදී යන බව කියැවේ. මෙය මාපියාවක් වැනි ඒකා බද්ධ සංවිධානයක්ව පවතී. මේවා සුප්‍රකට රහස් ය..

මුළු ජීවිත කාලයක් සේවය කොට විශ්‍රාම යන අසරණ ගුරු භවතෙකු, ලිපි කරුවකු සිය විශ්‍රාම වැටුප ලබාගැනීමට මෙසේ පගාව දෙමින් මාස ගණන් රස්තියාදු විය යුතුය. එක් සමයෙක මේ කටයුතු රජයේ සේවකයන් විසින් සිය රාජකාරිය ලෙස නියමිත ලිපි ගොනු අංක අනු පිළිවෙලට ඉටුකළ කාර්‍ය්‍ය වූහ. ජනගහනය වැඩිවීමත්, සමාජ අවශ්‍යතා වැඩිවීමත්, රාජ්‍ය අංශ අවශ්‍ය පරිදි ව්‍යාප්ත නොවී හිරවීමත් වැනි කරුණු මේ දූෂණ යන්ට තුඩුදී ඇත. මේ දැක්වූයේ මේ ව්‍යසනයන් ගැන ඉඟියක් පමණකි.

දේශපාලන ක්ෂෙත්‍රයේ බලපෑම් හා පිරිහීම්

1960 ගණන් වල සුළු මට්ටමෙන් රටේ කටයුතු වලට දේශපාලකයින්ගේ අයුතු බලපෑම් ඇරඹුණු ආකාරය මුලදී අපි සඳහන් කළෙමු. එය විවෘතවම බොහෝ විට පාලක පක්ෂවල ඉහලම ඇමති මට්ටම්වල සිටම ක්‍රියාත්මක වන්නට විය. අද එය යම් දෙයක් හොඳ හෝ නරක හෝ වේවා ඉටුකරගැන්මේ එකම මාර්ගය බවට පත්ව ඇත. මෙහිදී රටේ පවතින නීතිය ගැන කිසිදු තැකීමක් හෝ නීති ඇති බව සිතීමක් වත් මොවුන්ගේ නැත. ඇමති මන්ත්‍රීවරුන් පමණක් නොව ඔවුන්ගේ තරවිකාරයෝ සහ හෙංචයියලා ද විවෘතවම ගරති.

මැරවර බලය මුදල් බලය සහ පාතාලය

අසූ ගණන්වල සිටම දේශපාලන ජයග්‍රහණ සඳහා මැරවර බලය විවෘතවම යොදා ගැනීම ආරම්භවීම සමග ගණන්කාරයෝ, මැරවරයෝ සහ පාතාල නායකයෝ පවා මැති ඇමතිවරුන්ගේ බොඩිගාඩ්ලා බවට පත්වූහ. නීතිය අභිබවා යන්නටද මේ බලය යෙදිණ. මුදල්, පගාව සඳහා මන්ත්‍රී ඇමති වරප්‍රසාද ආදියද යෙදවිණ. බොහෝ



අම්මෝ මවෝ උඹ දිනපු එක ලොකු දෙයක්

කටයුතු ඉටුකර ගැන්මට ගෙවිය යුතු ගාස්තුව පවා පිළිගත් මට්ටම්වල වෙති. හොඳින් හෝ නරකින් මන්ත්‍රී ඇමතිකම් දිනා ගැන්ම හත්මුතු පරම්පරාවටම සෞභාග්‍යමත් අනාගතයකට මග පාදාගැන්මක් වීය. එහෙත් දේශපාලන වේදිකාවේ මොවුන් බෙරිහන් දෙන්නේ බලයට ආවොත් දූෂණය, අල්ලස් හා අපරාධ නැතිකරන බවට ය.

වරප්‍රසාද අයුතු ලෙස භුක්තිවිඳීම

දැන් සමහර ඇමතිවරු නිල කටයුතු සඳහා විදේශගතවන විට සිය භාර්යාව හා දරුපිරිස් පමණක් නොව නෑදෑ හිතවතුන් පවා රජයේ මුදලින් කැටුව යති. පිටරටවල තරුපහේ හෝටල්වල ගත කළ කාලය සඳහා දැවැන්ත බිල් රජයේ ගණනට වැටේ. මෑතකදී එසේ රජයේ ප්‍රබල ඇමතිවරයෙකු සිය දියණියගේ උපන්දින සාදය ඇමරිකා-වේ පැවැත්වූ බවත්, එයට ගිය වියදම රුපියල් වලින් මිලියන **4. 5** ක් හෙවත් ඇමරිකානු ඩොලර් **50** දහස ඉක්මවූ අතර ඇමතිවරයා එය ලංකා රජයේ වියදමට බැරකර ඇති බවක්ද ප්‍රචලිත විය.

පාතාලය සුද්ධ කරලීමේ ප්‍රබල ප්‍රයත්නයක් ඇතිබැව් පසුගිය දිනවල පුවත් පත්වල පළවිය. පාතාළ නායකයින් අල්ලාගැනීමද අවනත නොවූවන් ඝාතනය කරනු ලැබීම ගැනද පුවත් පළවිය. මේ අතරතුර මේ ළඟදී රජයේ ප්‍රබල ඇමතිවරයෙක් ඔහුගේ ආධාරකරුවෙකු වන, එහෙත් මත් ද්‍රව්‍ය සඳහා නම්දරා සිටි පාතාල නායකයෙකු කටුනායකට කැඳවාගෙන ගොස් පිට රටකට පැනයාමට සැළස්වූ බවද මේ ළඟදී පළවූ පුවතකි. මෙසේ දේශපාලනයේ ඉහළම මට්ටමේ සිටම සිය වරප්‍රසාද අයථා ලෙස පාවිච්චි කිරීම අද නුසුදුසු, නොකටයුතු හෝ ලැජ්ජා සහගත දෙයක් විදියටවත් නොසැලකෙන මට්ටමකට මුළු ශ්‍රීලංකා සමාජ පද්ධතියම අන්ත ලෙස පිරිහී, එය ගඳ ගසන, ඔඩුදුවන තුවාලයක් බවට පත්ව තිබීම සැබැවින්ම ඉතා ඛේදජනකය.

මේ පිරිහීම් වල අනිසි ආදීනව

පසුගිය යුද සමයේ බොහෝ ත්‍රස්ත කටයුතුවලට මේ සමාජ දූෂණ බෙහෙවින් උදව්වූ සැටි අපි දනිමු. කොටි ත්‍රස්තවාදීන් සඳහා සැපයුණු අවි ආයුධ, ගුවන් යානා සාදන උපකරණ කොටස් සහ සංනිවේදන උපකරණ ආදිය කිසිදු පරීක්ෂාවකින් තොරව කොළඹ වරාය සහ කටුනායක ගුවන් තොටුපල හරහා උතුරට ගෙන ගිය බවට තොරතුරු අනාවරණය විය. ආරක්ෂක අංශ රේගු අංශ පිරිහී තිබීම මෙයට ප්‍රධාන හේතුව විය.

එසේම ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන හෙවත් **INGO** කාරයින් කොටි ත්‍රස්තවාදීන්ට විවෘතවම ද්‍රව්‍යමය වශයෙන් උදව් දීමට දැවැන්ත කන්ටේනර් මගින් පවා බොහෝ දේ උතුරට ගෙන යාමට උදව් වී ඇත්තේ රාජ්‍ය අංශවල මේ දූෂණය බව දැන්වත් පැහැදිලි විය යුතුය. මෙවැනි දොරටු වැසුයේ නැතිනම් ඉදිරියේදී වුවද ඒවා රටේ ආරක්ෂාවට තර්ජනයක් වනු නොඅනුමානය.

සංවර්ධන ඉදිරිගමනට බාධකයක්

ඉදිරියේදී මුළු රටම සංවර්ධනය කරලීමේ පිම්මක් පැනීමට අද අපි සූදානම්ව සිටිමු. මේ සඳහා විදේශ ධන ආයෝජන සූදානම් බවද අපේ විශාල බලාපොරොත්තු ඇති බවද දනිමු. බොහෝ විදේශීය ආයෝජකයින් යම් රටක මුදල් යෙදවීමට පෙර එම රටේ රාජ්‍ය අංශය බැංකුපාලන කටයුතු ආදිය විමසා තක්සේරුකරති. ඒවා කර්යක්ෂම මට්ටමේ නොවේ නම් එම ආයෝජන වලට මැලිවෙති. මේ අංශ අතින් බලන විට අප රටේ පවතින වාර්තාව නම් ඉතා අසතුටුදායකය. අපගේම ඉදිරි සංවර්ධනය සඳහා මේ මළකඩ සුද්ධකර, තෙල්දමා, පාලන යන්ත්‍ර කාර්‍ය්‍යක්ෂම කරගැනීම අපගේම අනාගතය සඳහා අත්‍යවශ්‍ය බව කිව යුතුය. නැතිනම් අර ලැබීමට නියමිත ලොකු බැංකු ණය ගහට ඉනි කැපීමක් වෙනවා ඇත.

ජ්‍යෙෂ්ඨ පත්‍රකලාවේදීන්ට ස්වර්ණ සම්මාන

ස්වර්ණ සම්මාන ලාභී ජ්‍යෙෂ්ඨ පත්‍රකලාවේදීන් පස්දෙනා. වමේ සිට : අනුල ද සිල්වා, ලුවිස් බෙනඩික්, ජී. බාලසිංහම්, තලන්ගම ජයසිංහ සහ එස්. ෂන්මුගරාජා

ශ්‍රීලංකා කර්තෘ සංසදය හා ශ්‍රීලංකා පුවත්පත් ආයතනය එක්ව සංවිධානය කළ 2008 වසර සඳහා ජන මාධ්‍ය විශිෂ්ඨතා සම්මාන උළෙල පසු ගිය මස 14 වෙනි දින සවස ගල්කිස්ස මහ හෝටලයේ දී ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවතියේය

මෙහි දී අද දවසේ ශ්‍රීලංකාවේ ජාතික පුවත්පත්හි රැසක සේවය කරණ තරුණ හා වැඩිහිටි ප්‍රවීන මාධ්‍යවේදීන් හා මාධ්‍යවේදිනියන් රාශියකට පුවත්පත් කලාවේ විවිධ අංශයන් ආවරණය කරමින් ඔවුන් විසින් දක්වන ලද මාධ්‍ය දක්ෂතා අගැයීම් වස් සම්මාන ප්‍රදානය සිදු විය. උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් ආරාධනා ලැබ පැමිණ සිටියේ ඉන්දියාවේ චෙන්නායිහි සුප්‍රකට සමාජ සේවිකාවක වන මැග්සෙසේ සම්මාන දිනූ අරුණා රෝයි මහත්මියයි.

මෙම උත්සවයේ වූ විශේෂත්වය නම් ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ මාධ්‍ය වේදීන් පස් දෙනෙකු තෝරා ඔවුන් සිය ජීවිත කාලය පුරා පුවත්පත් කලාව වෙනුවෙන් සිදුකළ විශිෂ්ඨ මෙහෙය අගයකරමින් ඒ කලාවේදීන් ට ස්වර්ණ සම්මාන පිරිනැමීමයි. තලන්ගම ජයසිංහ, ලුවිස් බෙනඩික්, ජී. බාලසිංහම්, එස්. ෂන්මුගරාජා යන මහත්වරු සහ අනුල ද සිල්වා මහත්මිය ඒ පස් දෙනා වෙති.

තලන්ගම ජයසිංහ මහතාට ජීවිතකාලීන මාධ්‍ය මෙහෙයට ස්වර්ණ සම්මාන පිරිනැමුණු මොහොතයි.

තලන්ගම ජයසිංහ ප්‍රවීන සිත්තරාණන් ලංකාවිත්ති පාඨකයෝ හොඳින් හඳුනති. මේ පුවත්පතෙහි පළවන කාටූන් සහ මෙවර පිටකවර යද ඔවුන්ගේය. කලක් තිස්සේ මෙහි පළවන කවිකොළය ජයසිංහයන් චිත්‍රශිල්පයට පමණක් නොව කවිය ටද එකසේ දක්ෂබව මොනවට කියාපාන්නේය.

දකුණු තලංගම විජයවර්ධන පාඨශාලාවේ ඉගෙනුම ලැබූ තලන් ගම ජයසිංහ මහතා රජයේ කලාය තන යේ චිත්‍ර හා මූර්ති පාඨමාලාව හැදෑ රීමෙන් පසුව චිත්‍ර ශිල්පියෙකු ලෙස 1957 දී ලේක් හවුස් ආයතන යට බැඳුණේය. ජනතා, සිළුමිණ යන පුවත් පත්වල චිත්‍රශිල්පියා ලෙස කට යුතු කළ හෙතෙමේ 1980 දී ලේක් හවුසියේ මධුර චිත්‍රකතා පත්‍රයේ කතුවරයා වී 1998 දක්වා ඔහු එම තනතුර හෙබවීය. ඔහු චිත්‍ර ඇන්ද, සහ කතාව නිර්මාණය කළ චිත්‍රකතා සිය ගණනකි. ඇතැම් කතා නවකතා ලෙසින් ද බිහිවීය. සප්ත කන්‍යා චිත්‍රපටය තලන්ගේ එක් චිත්‍රකතාවක් අනුසාරයෙන් තැනුනකි. ශ්‍රීලංකාවේ ප්‍රකට ලේඛකයින්ගේ පොත් කවර සිය ගණනක් නිර්මාණය වූයේ ඔහුගේ තෙළිතුඩිනි. ඔහු ලියූ කවිපන්ති සියගණනකි. පිස්සු ඩබල් නම් කාව්‍ය සංග්‍රහ යක් සහ බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය හිමියන්ගේ චරිතාපදානයද ඔහු මෑතක පළ කළ කෘතීන් දෙකකි.

අනුල ද සිල්වා

අම්බලන්ගොඩ නිජබිම වූ, අනුල ද සිල්වා, පොල්වත්ත, බාලිකා විදුහල, ප්‍රජාපති සහ ධර්මාශෝක විද්‍යාල වලින් සිප්සතර හදාරා පේරාදෙනි විශ්වවිද්‍යාලයට ඇතුළු වූවාය. පසුව විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් ජනසංනිවේදනය සහ සාහිත්‍යය පිළිබඳ ඩිප්ලෝමාව ලැබූ ඇය ලේක්හවුස් ආයතනයට බැඳී ටික කලෙකින් එහි ජනප්‍රිය **මිහිර** ළමා පත්‍රයේද, පසුව **තරුණී** පත්‍රයේද කතුවරිය වූවාය. පසු කලෙක ඇය ලංකාදීප පත්‍ර අයතනයේ **සිරිකත** කාන්තා පුවත්පතේ කතුවරිය ද වූවාය. අනුල ද සිල්වා මහත්මිය විසින් ලියන ලද සහ පරිවර්තනය කරන ලද ළමා පොත් සංඛ්‍යාව **64** කි.

කළ හැකි පිළියම් ගැන යෝජනා කිපයක් කෙටියෙන්

1. රාජ්‍ය පරිපාලන අංශයේ සම්පූර්ණ ප්‍රතිසංවිධානයක් අවශ්‍යය. හැමදාමත් රාජ්‍ය පරිපාලනයේ ඇමතිවරු සිටියහ. එහෙත් දූෂණ මැඩලීමට ඔවුන් කළ දෙයක් නැත. මේ දූෂණ වැඩුණේද ඔවුන් යටතේමය. යල් පැනගිය ඒ **R, FR, JR** පකෙට දමා දැනට ඇති **MR** එකක්වත් ක්‍රියාවේ යෙදවිය යුතුය.

2. මේ දූෂණ සියල්ල මෙසේ සිදුවෙද්දීත් බැංකු අංශ, පෞද්ගලික අංශ කෙසේ හෝ කටයුතු යම් කාර්යක්ෂම මට්ටමකින් පවත්වාගෙන යති. මේවා ගැනත් විමසා, පිරික්සා බලා ඒ සමහර ක්‍රම රාජ්‍ය අංශ වලට යොදවා ගැනීම ගැන සොයාබැලිය යුතුය.

3. දේශපාලන අංශයේ ඉහළ සිට පහළටම තදබල ශුද්ධවීමක් අත්‍යවශ්‍යය. මේ සමහර අයථා කටයුතු වලට ඇස කන පියාගෙන සිටීමට ජනාධිපතිතුමාට කාලයක සිටම සිදුව ඇත්තේ පවතින දේශපාලන බල තුලනය නිසා බව අපි දනිමු. දැන් ප්‍රබල ආණ්ඩුවක් පිහිටුවීමට සුදුසු අවස්ථාව උදාවී ඇත. දැන් මේ යන ගමන නිවැරදියයි අපට සිතේ. ජනාධිපති වරණයක් පවත්වා, ඊළඟට මහ ඡන්දයක් පවත්වා පාර්ලිමේන්තුවේ කැපී පෙනෙන බලය ඇති ප්‍රබල රජයක් පිහිටුවිය යුතුය. ඒ සඳහා මහජනතාව අවබෝධයෙන් කටයුතු කරනවා ඇති අතරම, එවිට අද මේ දේශපාලන අංශවල කුණු රොඩු අතුගා දැමීම ඉතා සතුටින් මහජනතාව ඉටුකරනවා ඇත.

මේ සඳහා අප ජනතාවට දැනුම්වත් බව හා ශක්තිය ලබාදීමට අප හැම කටයුතු කළ යුතුය.